# ප්‍රසිද්ධ රඟ දැක්වීම් හා සැණකෙළි පිළිබඳ ආඥාපනත

## 176 වන අධිකාරය

1969 අංක 11 දරන ප්‍රසිද්ධ රඟ දැක්වීම් හා සැණකෙළි (සංශෝධන) පනතෙන් අවසන් වරට කරන ලද සංශෝධනය දක්වා සංශෝධන ඇතුළත් කර ඇත

පොදු පරීක්ෂණය සඳහා පමණි - ගාමිණී ජයසේකර

# ප්‍රසිද්ධ රඟ දැක්වීම් හා සැණකෙළි පිළිබඳ ආඥාපනත

## පටුන


| වගන්තිය | විස්තරය | පිටුව |
|---|---|---|
| 1. | ලුහුඬු නාමය | 1 |
| 2. | අර්ථ නිරූපණය | 1 |
| 3. | ප්‍රසිද්ධ රඟ දැක්වීම් විධිමත් කිරීම සඳහා රීති සෑදීමට අමාත්‍යවරයාට ඇති බලය | 2 |
| 3අ. | බලපත්‍රයක් නොමැති ව සැණකෙළියක් පැවැත්වීම තහනම් බව | 3 |
| 3ආ. | සැණකෙළි පවත්වන පරිශ්‍රයක සූදු ක්‍රීඩා කිරීම සහ ඒ හා සම්බන්ධ ලොතරැයි පැවැත්වීම තහනම් බව | 3 |
| 3ඇ. | සැණකෙළි විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථා සෑදීමට පළාත් පාලන ආයතනවල බලය | 3 |
| 4. | ආඥාපනතට පටහැනිව කරන වැරදිවලට දඬුවම් | 4 |
| 5. | 3 වන හා 4 වන වගන්ති මහා නගර සභා ප්‍රදේශවලට අදාළ නොවිය යුතු බව | 4 |
| 6. | මහජන ප්‍රදර්ශනය සඳහා සුදුසු බවට වන රඟ දැක්වීමේ සහතිකය | 4 |
| 7. | චිත්‍රපටයකට සම්බන්ධ ප්‍රචාරක දැන්වීමක සහතික කිරීමේ බලධාරියාගේ නියමයකට යොමුව | 7 |


පොදු පරිශීලනය සඳහා පමණි

පසු පරිශීලනය සඳහා පමණි - ගාමිණී ගුණසේකර

**176** වන අධිකාරය

# ප්‍රසිද්ධ රඟ දැක්වීම් හා සැණකෙළි පිළිබඳ

ප්‍රසිද්ධ රඟ දැක්වීම් හා සැණකෙළි වඩාත් විධිමත් කිරීම සඳහා; සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිමත් කිරීම පිණිස වූ ආඥාපනතකි. 1912 අංක 7 දරන ආඥාපනත 1919 අංක 7, දරන ආඥාපනත 1951 අංක 23, 1961 අංක 40, 1964 අංක 26, 1937 අංක 14, 1969 අංක 11, දරන පනත්

[1912 මැයි මස 24 වන දින]

1. මෙම ආඥාපනත ප්‍රසිද්ධ රඟ දැක්වීම් හා සැණකෙළි පිළිබඳ ආඥාපනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ ආඥාපනතේ- අර්ථ නිරූපණය. [§ 3, 1961 අංක 40]

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, කිසියම් මහා නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් ද;

"ප්‍රසිද්ධ රඟ දැක්වීම" යන්නෙන්,- [§ 3, 1961 අංක 40]

(අ) සෑම ප්‍රසිද්ධ නාට්‍ය නිරූපණයක් ද;

(ආ) සිනමා යන්ත්‍රයක්, මැජික් ලාම්පුවක් හෝ ඒ ආකාරයේ වෙනයම් උපකරණයක් මාර්ගයෙන් ප්‍රදර්ශනය කරනු ලබන සෑම චලන චිත්‍ර ප්‍රකාශයක් ද;

(ඇ) නැටුම්, විජ්ජා, ඉන්ද්‍රජාල, පිණුම්, සෑම බොක්සිං තරග, සර්කස්, විවිධ ප්‍රසංග හෝ වේදිකා මත කෙරෙන විනෝද ප්‍රසංග ද,

ඇතුළත් වන අතර, මුදල් ගෙවීමෙන් හෝ වෙනත් යම් ආකාරයකින් මහජනතාවට ඇතුළත් විය නොහැකි පුද්ගලික ස්ථානයක පවත්වනු ලබන සැණකෙළියක් හෝ වෙනයම් විනෝද ප්‍රසංගයක් ඊට ඇතුළත් නොවිය යුතු ය;

"සමාජ ශාලාව" යන්නෙන්, සංස්ථාගත වීමෙන් හෝ එසේ නොමැතිව පොදු අරමුණක් උදෙසා එකට ඒකරාශී වූ තැනැත්තන්ගෙන් සංයුක්ත වූ කවර හෝ සංගමයක් ද; [§ 3, 1969 අංක 11]

"සැණකෙළිය" යන්නෙන්, මුදල් ගෙවීමක් මත හෝ වෙනත් යම් ආකාරයකින් මහජනතාවට ඇතුළත් විය හැකි යම් උත්සවයක්, අරුමෝසම් පොළක් සහ සමාන ස්වරූපයේ වෙනත් කිසියම් විනෝද ප්‍රසංගයක් ඇතුළත් වන අතර, යම් ප්‍රසිද්ධ රඟ දැක්වීමක් ඊට ඇතුළත් නොවිය යුතු ය; සහ

"සිනමා ශාලාව" යන්නෙන්, සිනමා යන්ත්‍රයක්, මැජික් ලාම්පුවක් හෝ ඒ ආකාරයේ වෙනයම් උපකරණයක් මාර්ගයෙන් ප්‍රදර්ශනය කරනු ලබන සෑම චලන චිත්‍ර ප්‍රකාශයක් ප්‍රදර්ශනය කිරීමට සාමාන්‍යයෙන් පාවිච්චි කරනු ලබන යම් ස්ථානයක් ද; [§ 3, 1969 අංක 11]

අදහස් විය යුතු ය.

පටුන

ජනාධිපති නීතිඥ ගාමිණී දිසානායක

**3**. ප්‍රසිද්ධ රඟ දැක්වීම් විධිමත් කිරීම සඳහා සහ සාමාන්‍යයෙන් පිරිනැමී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැති ව, මෙහි පහත සඳහන් කාරණා පිළිබඳව අමාත්‍යවරයා විසින් රීති සෑදිය හැකි ය- ප්‍රසිද්ධ රඟ දැක්වීම් විධිමත් කිරීම සඳහා රීති සෑදීමට අමාත්‍යවරයාට ඇති බලය.

(අ) ප්‍රසිද්ධ රඟ දැක්වීම් සඳහා ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සෑදීම සඳහා හෝ කිසියම් විශේෂ පොදු ප්‍රදර්ශනයක් සඳහා හෝ බලපත්‍ර නිකුත් කිරීම හා ඒ බලපත්‍ර අවලංගු කිරීම, තහනම් කිරීම හෝ ඒවායෙහි ඇතුළත් කොන්දේසි වෙනස් කිරීම;

(ආ) ඒ බලපත්‍ර සඳහා ගාස්තු ගෙවීම;

(ඇ) ප්‍රසිද්ධ රඟ දැක්වීම්වල ස්වභාවය විධිමත් කිරීම;

(ඈ) ඉදිරිපත් කිරීමට යෝජිත කිසියම් ප්‍රසිද්ධ රඟ දැක්වීමක විස්තරයක් නියමිත බලධරයා වෙත ඉදිරිපත් කිරීම හා ඒ බලධරයා එසේ නියම කිරීම සුදුසු යයි අදහස් කරන්නේ නම්, ඒ රඟ දැක්වීම ප්‍රසිද්ධ කිරීමට හෝ ඉදිරිපත් කිරීමට පෙර එකී බලධරයා ඉදිරියේ එය ඉදිරිපත් කිරීම;

(ඉ) එවැනි රඟ දැක්වීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම හා ඒ අවසර පත්‍ර අවලංගු කිරීම, තහනම් කිරීම හා ඒවායෙහි ඇතුළත් කොන්දේසි වෙනස් කිරීම;

(ඊ) බලපත්‍ර නිකුත් කරනු ලැබූ ගොඩනැගිලිවල හෝ ඉදිකිරීම්වල ගොඩනැගිලි තත්ත්වය විධිමත් කිරීම හා ගින්නෙන්, තද බදයෙන්, අක්‍රමවත්බවින් හෝ වෙනත් අන්තරායවලින් මහජනයා ආරක්ෂා කිරීම;

(උ) බලපත්‍ර නිකුත් කරනු ලැබූ ගොඩනැගිලි හා ඉදිකිරීම් සහ ඒවායේ පවත්වන රඟ දැක්වීම් පරීක්ෂා කිරීම;

(ඌ) බලපත්‍ර නිකුත් කරනු නොලැබූ ගොඩනැගිලි සහ ඉදිකිරීම්වල පවත්වනු ලබන රඟ දැක්වීම් හෝ බලපත්‍ර නිකුත් කරනු ලැබූ ගොඩනැගිලිවල හෝ ඉදිකිරීම්වල බවත්වනු ලබන බලය නොලැබූ රඟ දැක්වීම් හෝ තහනම් කිරීම හා වැළැක්වීම.

(2) ඉහත සඳහන් ආකාරයෙන් සාදන ලද සියලුම රීති හැකිතාක් ඉක්මණින් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබිය යුතු ය. ඒ රීති පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමෙන් පසු දින හතළිහක් ඇතුළත දී එයින් කිසියම් රීතියක් අවලංගු කළ යුතු යයි සම්මත කරනු ලැබුවහොත්, එකී රීතිය එදින පටන් නිෂ්ප්‍රභ වන අතර ඒ යටතේ කරන ලද කිසිවකට එයින් බාධාවක් නොවිය යුතු ය.

**3**අ. (1) කිසියම් පළාත් පාලන ආයතනයකින් ඒ සඳහා ලබාගත් බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තකු විසින් ඒ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය ඇතුළත වූ කවර හෝ තැනක සැණකෙළියක් පැවැත්වීම නොකළ යුතු ය. බලපත්‍රයක් නොමැතිව සැණකෙළියක් පැවැත්වීම තහනම් බව. [§ 4, 1964 අංක 26]

(2) පොලිස්පතිවරයාගේ එකඟතාව ලබාගෙන ඇත්තේ නම් මිස, පළාත් පාලන ආයතනයක් විසින් (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

(3) කිසියම් සැණකෙළියක් සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රයකින්, ඒ සැණකෙළිය පවත්වනු ලබන පරිශ්‍රය ඇතුළත, සූදු ක්‍රීඩාවේ යෙදීම හෝ කවර හෝ ආකාරයකින් සූදු ක්‍රීඩාවට සමාන ස්වරූපයේ වූ ක්‍රියාවක් කිරීම හෝ ඒ සඳහා පෙළඹවීමක් හෝ අවසර දීමක් කර නොමැති බව සහ බලපත්‍රලාභියා විසින් ඒ පරිශ්‍රය ඇතුළත හෝ ඒ සැණකෙළිය හා සම්බන්ධව ලොතරැයියක් පැවැත්වීම හෝ ඒ සඳහා පෙළඹවීම හෝ නොකළ යුතු බවට ඒ සෑම බලපත්‍රයක කොන්දේසියක් විය යුතු ය.

(4) මේ ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක හෝ යම් පළාත් පාලන ආයතනයක් විසින් යම් තැනැත්තකු වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රයක හෝ ඇතුළත් යම් කොන්දේසියක් ඒ තැනැත්තා විසින් උල්ලංඝනය කර ඇති බවට ඒ පළාත් පාලන ආයතනය සෑහීමට පත් වී ඇති අවස්ථාවක, ඒ බලපත්‍රය අවලංගු කිරීම හෝ අත්හිටුවීම ඒ පළාත් පළාත් පාලන ආයතන විසින් කළ හැකි ය.

**3ආ.** සැණකෙළියක් පවත්වනු ලබන පරිශ්‍රයක් ඇතුළත සූදු ක්‍රීඩාවේ යෙදීම හෝ කවර හෝ ආකාරයකින් සූදු ක්‍රීඩාවට සමාන ස්වරූපයේ වූ ක්‍රියාවක් කිරීම හෝ ඒ සඳහා පෙළඹවීම හෝ ඒ සැණකෙළිය හා සම්බන්ධව ලොතරැයියක් පැවැත්වීම හෝ ඒ සඳහා පෙළඹවීම හෝ කවර හෝ තැනැත්තකු විසින් නොකළ යුතු ය.

සැණකෙළි පවත්වන පරිශ්‍රයක සූදු ක්‍රීඩා කිරීම සහ ඒ හා සම්බන්ධ ලොතරැයි පැවැත්වීම තහනම් බව.
[§ 4, 1964 අංක 26]

**3ඇ.** (1) පළාත් පාලන ආයතනයකට සාමාන්‍යයෙන් පිරිනැමී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැති ව, සැණකෙළි විධිමත් කිරීම, පරීක්ෂා කිරීම හා පාලනය කිරීම සහ එයට විශේෂ වන පරිදි, මෙහි පහත සඳහන් කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් පිළිබඳව ඒ යම් පළාත් පාලන ආයතනයක් විසින් අතුරු ව්‍යවස්ථා සෑදිය හැකි ය-

සැණකෙළි විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථා සෑදීමට පළාත් පාලන ආයතනවල බලය.
[§ 4, 1964 අංක 26]

(අ) සැණකෙළිවලට සම්බන්ධ බලපත්‍ර නිකුත් කිරීමේ දී ගෙවිය යුතු ගාස්තු;

(ආ) එකී බලපත්‍රවල කොන්දේසි; සහ

(ඇ) ගින්නෙන්, තද බදයෙන්, අක්‍රමවත්බවින් හෝ වෙනත් අන්තරායවලින් මහජනයා ආරක්ෂා කිරීම.

(2) පළාත් පාලන ආයතනයක් විසින් සාදනු ලබන සෑම අතුරු ව්‍යවස්ථාවක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයේ සිට හෝ එහි නිශ්චිතව නියම කරනු ලැබිය හැකි යම් ඉදිරි දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) පළාත් පාලන ආයතනයක් විසින් සාදනු ලැබූ සෑම අතුරු ව්‍යවස්ථාවක් ම, ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීමෙන් පසු ව, හැකිතාක් පහසු ඉක්මණින් අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව ඉදිරියේ තැබිය යුතු ය. කිසියම් අතුරු ව්‍යවස්ථාවක් පාර්ලිමේන්තුව විසින් අනුමත නොකළ හොත්, එතෙක් ඒ යටතේ කරන ලද කිසිවකට හානියක් නොමැති ව ඒ අනනුමතයේ දින සිට ඒවා අවලංගු විය යුතු ය.

**4.** 3අ වන වගන්තියේ හෝ 3ආ වන වගන්තියේ හෝ මේ ආඥාපනත යටතේ සාදන ලද කිසියම් රීතියක් හෝ අතුරු ව්‍යවස්ථාවක් කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු කිරීමෙන් පසුව රුපියල් එක්

ආඥාපනතට පටහැනිව කරන වැරදිවලට දඬුවම්.
[§ 5, 1964 අංක 26]

දහසකට නොවැඩි දඩයකට හෝ බරපතල නොවන මාස හයකට නොඅඩු කාලයකට බන්ධනාගාරගත කිරීමේ දඬුවමකට යටත් විය යුතු ය.

*3 වන හා 4 වන වගන්ති මහා නගර සභා ප්‍රදේශවලට අදාළ නොවිය යුතු බව.*
*[§ 2, 1964 අංක 26]*

**5.** (1) මහා නගර සභා ආඥාපනතේ 272 වන වගන්තියේ (18) වන ඡේදයෙන් මහා නගර සභාවලට ලැබී තිබෙන බලතල යටතේ ප්‍රසිද්ධ රඟ දැක්වීම් හෝ සැණකෙළි විධිමත් කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සාදා තිබෙන හෝ ඉදිරියේ දී සාදා ගත හැකි හෝ මහා නගර සභා ප්‍රදේශයක් සම්බන්ධයෙන් මේ ආඥාපනතේ 3 වන සහ 4 වන වගන්ති අදාළ නොවිය යුතු ය. එසේ වුව ද, එකී ඡේදයෙන් මහා නගර සභාවලට දෙන ලද අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලතලවලට මේ ආඥාපනතින් අමාත්‍යවරයා වෙත පවරන ලද සියලු බලතල ද ඇතුළත් වී ඇති සේ සැලකිය යුතු ය. එසේ ම, එකී ඡේදය යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවකට පටහැනිව යම් තැනැත්තකු විසින් කරනු ලබන වරදක දී ඒ අතුරු ව්‍යවස්ථාව මේ ආඥාපනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් පරිදි ම ඒ තැනැත්තා ඊට යටත් වන අතර නාගරික මහේස්ත්‍රාත්වරයකුට ඒ නඩුව විසඳීමට බලය තිබිය යුතු ය.

*[§ 2, 1964 අංක 26]*

(2) එසේ වුව ද, (1) වන උපවගන්තිය සමග කියවිය යුතු මහා නගර සභා ආඥාපනතේ 272 වන වගන්තියෙහි (18) වන ඡේදයෙහි හෝ සැණකෙළි විධිමත් කිරීම සඳහා ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් අනුව, මහා නගර සභා බල ප්‍රදේශයක් ඇතුළත සැණකෙළියක් පැවැත්වීමට බලපත්‍ර නිකුත් කිරීමට පෙර පොලිස්පතිවරයාගේ එකඟතාව ලබා ඇත්තේ නම් මිස, ඒ බලපත්‍රය නිකුත් නොකළ යුතු ය.

*මහජන ප්‍රදර්ශනය සඳහා සුදුසු බවට වන රඟ දැක්වීමේ සහතිකය.*
*[§ 4, 1969 අංක 11]*

**6.** (1) (අ) (9) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව යම් ප්‍රසිද්ධ රඟ දැක්වීමක් මහජනයා ඉදිරියේ පෙන්වීමට සුදුසු බවට සහතික කරන බලධරයා විසින් එය සහතික කරනු ලැබ ඇත්තේ නම් හා එසේ ම එම සහතිකය අවලංගු කර නොමැති නම් මිස, එය -

(i) කිසියම් පරිශ්‍රයක් ඇතුළත නැතහොත් පොදුවේ හෝ පුද්ගලිකව මහජනයාට; හෝ

(ii) මහා නගර සභාවක් හෝ වෙන යම් පළාත් පාලන ආයතනයක් විසින් ඒ අවස්ථාව වන විට, ප්‍රසිද්ධ රඟ දැක්වීමක් සඳහා භාවිත කළ හැකි වන පරිදි නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් සහිත යම් සිනමා ශාලාවක්, ගොඩනැගිල්ලක්, ඉදිකිරීමක් හෝ වෙනත් පරිශ්‍රයක් ඇතුළත යම් සමාජ ශාලාවක සාමාජිකයන්ට,

ප්‍රසිද්ධ රඟ දැක්වීමක් පැවැත්වීම නොකළ යුතු ය.

(ආ) සහතික කිරීමේ බලධාරියා වෙත ඉදිරිපත් කර නොමැති, නැතහොත් ඔහු විසින් නිරීක්ෂණය කරන නොලැබූ, යම් සිනමා යන්ත්‍රයක්, මැජික් ලාම්පුවක් හෝ ඒ ආකාරයේ වෙනයම් උපකරණයක් මාර්ගයෙන් ප්‍රදර්ශනය කරනු ලබන සෑම චලන චිත්‍ර ප්‍රකාශයක් ම-

(i) කිසියම් පරිශ්‍රයක් ඇතුළත නැතහොත් පොදුවේ හෝ පුද්ගලිකව මහජනයාට; හෝ

(ii) මහා නගර සභාවක් හෝ වෙන යම් පළාත් පාලන ආයතනයක් විසින් ඒ අවස්ථාව වන විට, ප්‍රසිද්ධ රඟ දැක්වීමක් සඳහා භාවිත කළ හැකි වන පරිදි



පටුන

නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් සහිත යම් සිනමා ශාලාවක්, ගොඩනැගිල්ලක්, ඉදිකිරීමක් හෝ වෙනත් පරිශ්‍රයක් ඇතුළත යම් සමාජ ශාලාවක සාමාජිකයන්ට,

ප්‍රදර්ශනය නොකළ යුතු ය.

(2) ශ්‍රී ලංකාව මුළුල්ලේම හෝ ශ්‍රී ලංකාවේ යම් විශේෂිත ප්‍රදේශයක් සඳහා මේ වගන්තියේ සහතික කිරීමේ බලධාරීන් වශයෙන් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් යම් තැනැත්තකු හෝ තැනැත්තන් නාමයෙන් හෝ නිල නාමයෙන්, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි අතර සහතික කිරීමේ බලධාරියා විසින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි විධානයන්ට අනුකූලව මේ වගන්තියේ බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කළ යුතු ය.

(3) සහතික කිරීමේ බලධාරියකුට-

(අ) මහජන ප්‍රදර්ශනය සඳහා සුදුසු බවට යෝජිත කිසියම් ප්‍රසිද්ධ රඟ දැක්වීමක බලපෑම පිළිබඳ සහතිකය, ප්‍රදානය කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට; සහ

(ආ) (අ) ඡේදය යටතේ කලින් ප්‍රදානය කරන ලද කිසියම් සහතිකයක් නියමයක් මගින් අවලංගු කිරීමට,

අභිමතය පැවතිය යුතු ය.

එකී අවලංගු කිරීමේ සෑම නියමයක් ම, සහතික පත්‍රය නිකුත් කළ ඉල්ලුම් පත්‍රයේ විස්තර කර ඇති තැනැත්තාට භාර දිය යුතු අතර එසේ භාරදුන් දිනයේ සිට ඒ අවලංගු කිරීම ක්‍රියාත්මක විය යුතු ය.

(4) කිසියම් ප්‍රසිද්ධ රඟ දැක්වීමක් සඳහා, (3) වන උපවගන්තිය යටතේ සහතික කිරීමේ බලධාරියා විසින් සහතික පත්‍රයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ නිකුත් කළ සහතිකයක් අවලංගු කිරීමේ නියමයක් හෝ කර ඇති විටෙක, ඒ ප්‍රතික්ෂේප කිරීමේ හෝ අවලංගු කිරීමේ නියමයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ ප්‍රතික්ෂේප කිරීමට හෝ අවලංගු කිරීමට එරෙහිව නියමිත ආකාරයෙන් අමාත්‍යවරයා වෙත අභියාචනයක් කළ හැකි අතර ඒ අභියාචනය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණය, තීරණාත්මක හා අවසානාත්මක විය යුතු ය.

(5) කිසියම් යෝජිත ප්‍රසිද්ධ රඟ දැක්වීමක් සඳහා මේ වගන්තියෙන් පවරා දෙන ලද හෝ බලය දෙන ලද බලතල හා කාර්යයන් ක්‍රියාවේ යෙදවීම සඳහා, ඒ ප්‍රදර්ශනය හෝ ඉදිරිපත් කිරීම සහතික කිරීමේ බලධාරියා හෝ අමාත්‍යවරයා හෝ වෙනත් යම් විශේෂිත තැනැත්තන් ඉදිරියේ ඉදිරිපත් කරන ලෙස අමාත්‍යවරයා හෝ සහතික කිරීමේ බලධාරියා විසින් නියම කළ හැකි ය.

(6) මේ වගන්තියේ ඉහත දැක්වෙන විධිවිධාන යටතේ කිසියම් චිත්‍රපටයක් මහජන ප්‍රදර්ශනය සඳහා සුදුසු බවට සහතික කර ඇති අවස්ථාවක, ඒ චිත්‍රපටය සහතික කිරීමේ බලධාරියා විසින් නියමිත ආකාරයෙන් සලකුණු කළ හැකි අතර එසේ සලකුණු කිරීමෙන් පසුව එයට කෙරෙන එකතු කිරීමක් හෝ සංශෝධනයක්

සඳහා එසේ සහතික කර නොමැති නම්, ප්‍රදර්ශනය කිරීම හෝ ඉදිරිපත් කිරීම නොකළ යුතු ය.

(7) 3 වන වගන්තිය යටතේ සාදන ලද කිසියම් රීතියක හෝ 5 වන වගන්තිය යටතේ සාදන ලද කිසියම් අතුරු ව්‍යවස්ථාවක සඳහන් විධිවිධානවලට සහ ඊට අතිරේකව මේ වගන්තියේ ඉහත දැක්වෙන විධිවිධාන ද බල පැවැත්විය යුතු අතර මහජන ප්‍රදර්ශනය සඳහා කිසියම් යෝජිත ප්‍රසිද්ධ රඟ දැක්වීමක් සුදුසු බවට මේ වගන්තිය යටතේ සහතික කිරීම සඳහා කෙරෙන ප්‍රදර්ශනය කිරීම හෝ ඉදිරිපත් කිරීම, එකී රීති හෝ අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු ලැබීම හෝ තේරුම් ගැනීම හෝ නොකළ යුතු ය.

(8) මේ වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් කිසියම් ප්‍රසිද්ධ රඟ දැක්වීමක් ප්‍රදර්ශනය කරනු ලැබුවහොත් හෝ ඉදිරිපත් කරනු ලැබුවහොත් එකී ප්‍රදර්ශනය පෙන් වූ හෝ ඉදිරිපත් කළ ස්ථානයේ එවකට පදිංචි වීමට බලය ඇති තැනැත්තා සහ ඒ සඳහා වගකිව යුතු සෑම තැනැත්තකු ම, හෝ ඒ රඟ දැක්වීම ප්‍රදර්ශනය කිරීමට හෝ ඉදිරිපත් කිරීමට සහභාගි වූ හෝ වෙනත් ආකාරයකින් සම්බන්ධ වූ සෑම තැනැත්තකු ම, වරදකට වරදකරු සහ වගකිව විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් වරදකරු කිරීමෙන් පසුව රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ දෙයාකාරයෙන් එක් ආකාරයක මාස හයකට නොඅඩු කාලයකට බන්ධනාගාරගත කිරීමේ දඬුවමකට යටත් විය යුතු ය.

(9) මේ වගන්තියේ ඉහත දැක්වෙන විධිවිධාන-

(අ) කිසියම් ඇස්බැන්දුම් ප්‍රදර්ශනයකට හෝ විජ්ජා හෝ කිසියම් බොක්සිං තරගයකට; හෝ

(ආ) (10) වන උපවගන්තිය යටතේ සාදන ලද නියමයක විධිවිධාන අනුව නිදහස් කළ හැකි කිසියම් පන්තියක හෝ විස්තරයක ඇතුළත් රඟ දැක්වීමක් වන කවර හෝ රඟ දැක්වීමකට,

අදාළ නොවිය යුතු ය.

(10) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නියමයන් කළ හැකි ය:- [§ 4, 1969 අංක 11]

(අ) කිසියම් ප්‍රසිද්ධ රඟ දැක්වීමක් සහතික කිරීමේ බලධාරියා විසින් නිරීක්ෂණය කිරීම සහ ඉදිරිපත් කිරීම වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තු තීරණය කිරීම;

(ආ) එකී ගාස්තු එකතු කිරීම හෝ රැස් කිරීම හෝ අය කිරීම හා එසේ අයකර ගත් හෝ රැස් කර ගත් මුදල් ආපසු ගෙවීම සඳහා විධිවිධාන සැලසීම;

(ඇ) මේ වගන්තියේ නියමිත අවශ්‍යතා හෝ එයින් බලය ලැබී ඇති කිසියම් කාරණයක් සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම ද ඇතුළත් ව, මේ වගන්තියේ ප්‍රතිපත්ති හා කාර්යයන් සඳහා සහාය වීමට හෝ ක්‍රියාත්මක කිරීමට සුදුසු යයි අමාත්‍යවරයා අදහස් කරන විධිවිධාන සැලැස්වීම.

පටුන

(11) මේ වගන්තියේ "අමාත්‍යවරයා" යන්නෙන්, රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ.

චිත්‍රපටයකට සම්බන්ධ ප්‍රචාරක දැන්වීමක සහතික කිරීමේ බලධාරියාගේ නියමයකට යොමුව. [§ 5, 1969 අංක 11]

**7.** කිසියම් ප්‍රසිද්ධ රඟ දැක්වීමක සහතික කිරීමේ බලධාරියාගේ පූර්ව එකඟතාව නොමැති ව, ඔහුගේ නියමය හෝ තීරණය පිළිබඳ යොමුවක් හෝ එහි කිසියම් කොටසක් මුද්‍රණය කරන, ප්‍රසිද්ධ කරන, තැපෑලෙන් බෙදා හරින, හෝ මුද්‍රණය කිරීමට පොළඹවන, යම් පුවත් පත් දැන්වීමක් පළ කරන, අත් පත්‍රිකා, ප්‍රචාරක දැන්වීම් හෝ පත්‍රිකා ප්‍රදර්ශනය කරන කිසියම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් වරදකරු කිරීමෙන් පසුව රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ දෙයාකාරයෙන් එක් ආකාරයක මාස හයකට නොඅඩු කාලයකට බන්ධනාගාරගත කිරීමේ දඬුවමකට යටත් විය යුතු ය.

පටුන

පළමු පරිශීලනය සඳහා පමණි - ගාමිණී ගුණදේවර